# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2167/18 - 2020 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2020.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 40/1973(I)

**(222 අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

1925 ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වූ නිරෝධායන නියෝග හා ඇන්ව්ලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වූ නියෝග සහ 1960 නිරෝධායන නියෝග යටතේ වූ නිවේදනය

(222 අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සාදන ලද, 1925 අගෝස්තු මස 28 වන දින, අංක 7481 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1925 ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන නිරෝධායන නියෝග හා ඇන්ව්ලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නියෝග සහ 1960 මැයි මස 6 වන දින, අංක 12,125 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1960 නිරෝධායන නියෝග මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය, පවිත්‍රා වන්නිආරච්චි වන මා විසින් මේ නිවේදනය මගින් කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) නිරෝධායනීය රෝගයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි (පා.ම),**
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය.

2020 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*